# කුසගිනි නිවන සියුමැලි දෑත්

කාන්තාව මවක ලෙස කරනු ලබන කාර්යභාරයේදී අපට අමතක කළ නොහැකි කරුණක් වන්නේ ඇය මන්දපෝෂණය නැති කිරීමට කරනු ලබන කාර්ය භාරයයි. මෙහිදී ඇය මාස 4 සිට අවුරුදු 6 දක්වා දරුවන්ට මව්කිරි දීම කරනු ලබයි. අර්ධ ඝන ඝන ආහාර හඳුන්වා දීමත් පවුල්වල සෞඛ්‍ය සංරක්ෂණය සම්බන්ධයෙන්ද විශාල කාර්යභාරයක් සිදු කරයි. පවුල තුළ ඇති අපිරිසිදුකම ඉවත්කර පිරිසිදුකම ඇති කිරීමටද කටයුතු කරන්නී කාන්තාවයි. කාන්තාව ගෘහනියක් ලෙස කරනු ලබන කාර්යභාරයේදී පවුල තුළ ලැබෙන ආදායමට සරිලන වියදම් සකස් කරමින් කටයුතු කරන අතර ආහාර සුරක්ෂිතතාවය කෙරෙහිද අවධානය යොමු කරවයි. අඩු වියදම් පෝෂ්‍යදායී ආහාර තෝරාගෙන එදිනෙදා පරිභෝජනයට සොදා ගනිමින්, සමබර ආහාරවේලක් සකස්කරමින්, කාර්යශීලීව දකිමින් කටයුතු කරන අතර පවුලේ වියදම් තත්ත්වය පාලනය කරමින් විශාල මෙහෙවරක් කරනු ලබයි. තවද ඇය පවුලේ ආර්ථික විශේෂඥවරියක් වශයෙන්ද කටයුතු කරනු ලබයි.

මෙම වර්ෂයේ ලෝක ආහාර දිනය සඳහා තෝරාගෙන ඇති තේමාව "ලෝකයට ආහාර සපයන්නී කාන්තාවයි" යන්නය. මේ යටතේ කථා කිරීම එමෙන්ම ලිවීම ඉතාම කාලෝචිත බැවින් මේ සම්බන්ධයෙන් කාන්තාවගේ දායකත්වය දෙස විමර්ශනාත්මකව අවධානය යොමුකළ යුතු වේ.

අද ලෝකයේ ජනගහනයට අවශ්‍ය ප්‍රමාණයට වඩා ආහාර නිෂ්පාදනය කෙරෙන නමුදු ලෝක ජනගහනයෙන් 1/5ක් එනම් කෝටි 80 ට වැඩි ප්‍රමාණයක් දිනපතා සාගින්නෙන් පෙළෙන බවත් එයින් කෝටි 20 කට අධික සංඛ්‍යාවක් කුඩා දරුවන් බවත් ප්‍රකාශ වේ. 1996 නොවැම්බර් මස පවත්වන ලද ලෝක ආහාර සමුළුවේදී රටවල් 186ක රාජ්‍ය නායකයෝ ලෝකයේ "සාගින්න" නිවන බවට පොරොන්දු දුන්හ. එහෙත් අද එම රාජ්‍යයන් බොහොමයක් ගැම් ගිවිසුම ලෝක වෙළඳ සංවිධානය වැනි ජාත්‍යන්තර ගිවිසුම් යටතේ ක්‍රියා කරනු ලබයි. එම ක්‍රියාදාමයන් ඔස්සේ සිදුවන "ලෝකගතකරණය" හෙවත් ජාත්‍යන්තර වෙළඳපොළ විවෘත කිරීමේ ක්‍රියාවලිය මගින් ආහාර හා කෘෂිකර්ම ක්ෂේත්‍රයේ සියළු බලය හා ආධිපත්‍යය දැවැන්ත බහුජාතික සමාගම්වල පාලනයට නතු කෙරේ.

**හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ අලෙවි සහකාර සරත් විජයගුණවර්ධන විසිනි.**

1977 පටන් ශ්‍රී ලංකාවේද සිදුවන මෙම ක්‍රියාවලිය මගින් මෙරට ස්වාභාවික සම්පත් භූමිය, ජලය, ගහකොළ ආදිය ග්‍රාමීය ජනතාවට අහිමිවෙමින් පවතින තත්ත්වයක් උදාවී ඇත. ආහාර සුරක්ෂිතතාව ඇතිකර ගැනීම සඳහා වසර දහස් ගණනක් පුරා ගොවිතැන් කළ කුඩා ගොවීන් හා ග්‍රාමීය කාන්තාවන් අද සාගින්නට, මන්දපෝෂණයට, ණයගැතිභාවයට හා අනාථභාවයට, සිය දිවි නසා ගන්නා ඉරනමකට ගොදුරු කරනු ලැබ ඇත. ලෝක බැංකුව මගින් යෝජනා කොට දැනට ක්‍රියාත්මක වෙමින් පවතින සැළසුම් මගින් උත්සාහ කරනුයේ දැනට ලක්ෂ 18 පමණ වන කුඩා ගොවි පවුල් ද තවත් ලක්ෂ ගණන් කුඩා ධීවර පවුල් හා වතු කම්කරුවන් හා සෙසු දුප්පතුන් ඔවුන් සතු තම ජීවන මාර්ග වලින් ඉඩම්වලින්, මුහුදු හා ජල සම්පත්වලින් බැහැර කර වීමය. මේ සඳහා රටේ වැව්, ජලාශ ආදිය පෞද්ගලිකකරණය කිරීමට යෝජනා කර ඇත. රටේ ඇති ඖෂධ ශාක හා බීජ සම්පත්වල අයිතියද විශාල සමාගම්වලට පැවරෙන පරිදි "බුද්ධිමය දේපල අයිතිය" වැනි නීති සම්පාදනය කරමින් පවතී. මෙබඳු තත්ත්වයන් යටතේ තමන්ගේ මෙන්ම තම දරුවන්ගේද රටේ සෙසු දුප්පත් ජනතාවගේ ආහාර ලැබීමේ අයිතිය රැක ගැනීම සඳහා යෝග්‍යවන කෘෂිකර්ම ක්‍රම හා ප්‍රතිපත්ති සකස් කර ගැනීමේදී අපගේ ඉතිහාසය පුරා කුඩා ගොවීන් හා ග්‍රාමීය කාන්තාව විසින් ගොඩනගාගත් කෘෂිකාර්මික දැනුම, ආහාර රටාවන් හා දේශීය ඥානය බෙහෙවින් වැදගත් වන්නේය.

කාන්තාව සැබැවින්ම ලෝකයට ආහාර සපයන්නීද අපි මේ පිළිබඳ විමසා බලමු. ලෝක පරිමාණයෙන් නිෂ්පාදනය කෙරෙන එනම් වගා කරන මුළු ආහාර ප්‍රමාණයෙන් හරි අඩකටත් වඩා වගා කෙරෙනුයේ කාන්තාව අතිනි. උප සහරා,

අප්‍රිකානු සහ කැරිබියානු මහාද්වීපවල මූලික ආහාර ද්‍රව්‍යවලින් 80%ක පමණ වගා කරනුයේ කාන්තාව අතිනි. ආසියාකරයේ නිෂ්පාදනය කෙරෙන සහල් ප්‍රමාණයෙන් 50% සිට 90% දක්වා ශ්‍රමය සපයන්නෝ ඔවුහුය. අග්නිදිග ආසියානු කලාපය, පැසිපික් කලාපය, සහ ලතින් ඇමෙරිකානු කලාපය තුළ කාන්තාව විසින් පවත්වාගෙන යනු ලබන ගෙවතු වගාවන් දැනට හඳුනාගෙන ඇති සංකීර්ණ කෘෂිකාර්මික පද්ධතීන්වේ. පරිවර්තනය වෙමින් ඇති (නැගෙනහිර යුරෝපීය) රටවල කෘෂිකර්මයේ නිරතව සිටින ග්‍රාමීය කාන්තාවන්ගේ ප්‍රතිශතය බොස්නියාව, හර්සගොවිනියාව යන රටවල 1/3 වන අතර පෝලන්තයේදී එය අඩකට වඩා වැඩිවේ.

> සිව්පසය එනම් චීවර, පිණ්ඩපාත, සේනාසන, ගිලාන ප්‍රත්‍ය භික්ෂු සංඝයා කෙරෙහිද ගිහියන් උදෙසා එය ඇඳුම්, පැළඳුම්, ආහාර පාන නිවාස සහ බෙහෙත් යන අරුතින්ද භාවිතාවේ. මේ අතරින් අන්නපාන හෙවත් ආහාර පාන සෑම ජීවියෙකුටම භේදයකින් තොරව අත්‍යවශ්‍ය මූලික අංගයන් බව නම් පැහැදිලිය. එය සබ්බේ සත්තා ආහාර ඨිතිකා "සියලු සත්වයෝ ආහාර මත යැපේ" යන බුදු වදනින් "ප්‍රාණිනාං පුනර් මූලස්ථා හාර (ජීවීන්ගේ පැවැත්මට ආහාර මූලික වේ.) යන සංස්කෘත වදනින් ද සනාථ වේ.

සංවර්ධනය වන ලෝකය පුරා ගොවිතැනට අවශ්‍ය ශ්‍රමය වැඩි වශයෙන් සපයනු ලබන්නේ කාන්තාව විසිනි. එයට බිම් සකස් කිරීමේ සිට අස්වනු නෙළීම දක්වා වන සියලු කාර්යයන් අයත්වේ. අස්වනු කැපීමෙන් පසු ගබඩා කිරීම, පැටවීම, තොග ගැසීම, අලෙවි කිරීම හා සැකසීම යන කාර්යයන් මීට අයත්ය. ග්‍රාමීය ප්‍රදේශවල සිටින කාන්තාවන් සිය දරුවන්ගේ පෝෂණය, පිළිබඳ මූලික වගකීම් මුළුමනින්ම පාහේ දරති. ගර්භනී අවස්ථාවේ සිට කිරිදෙන අවස්ථාව දක්වාත් වර්ධනයේ තීරනාත්මක කාල පරිච්ඡේදය පුරාත් අවශ්‍ය කාර්යයන් ඉටුවන්නේ ඔවුන් අතිනි. මීට අමතරව පවුලේ සෙසු අය සඳහා ආහාර සැකසීම හා පිසීම කරන්නේද ඔවුහුය. ආහාර සුරක්ෂිතතාව සඳහා ඔවුන් කරන මෙම දායකත්වය විශාල වන නමුදු සංවර්ධන ක්‍රියාවලිය තුළ ඔවුන් සිටින්නේ බොහෝ දුරට අදිසි (නොපෙනෙන) ක්‍රියාකරුවන් වශයෙනි. බොහෝ විට ඔවුන් කරන කටයුතු සංඛ්‍යා ලේඛනවල හෝ වාර්තාවල සටහන් නොවේ. එහි ප්‍රතිඵලයක් වශයෙන් ඔවුන්ගේ දායකත්වය වටහා ගැනීම සහ තක්සේරුව කරන්නේ අඩුවෙන්ය. මෙයට බොහෝ හේතු සාධක ඇත. නිවසේදී කරන බොහෝ වැඩ සලකනු ලබන්නේ භාර්යාවන් වශයෙන් හා මවක් වශයෙන් ඇයගෙන් ඉටුවිය යුතු යුතුකම් ලෙස මිස ගෘහයේදී හෝ ජාතික ආර්ථිකයේදී සැලකිල්ලට ගතයුතු රැකියාවන් වශයෙන් නොවේ. පවුලේ කටයුතුවලින් බැහැරව ග්‍රාමීය කාන්තාවන් විසින් වැය කරනු ලබන ශ්‍රමය නිතිපතා හෝ කළින් කළට කරන වැඩ වුවත් ගෙවීමකින් තොරව සිදුවේ. එබැවින් ඒවා නිල සංඛ්‍යා ලේඛනවලදී ගණන් බැලීමට අතුළත් නොවේ.

බොහෝ රටවල කාන්තාවෝ ඔවුන් වගා කරණ භූමියේ හිමිකරුවන් නොවෙති. ඔවුනට නිත්‍යානුකූල අයිතියක් නැත. ඉඩම් උරුමවීම සහ ඉඩම් අයිතිය ලබා ගැනීම පිළිබඳව තවමත් ප්‍රචලිතව ඇත්තේ කාන්තාවන්ට අඩු අයිතියක් ලැබෙන නීතිරීති හා අනපනත්ය. කාන්තාවන්ට අයත්වන ඉඩම් බොහොමයක් ඉතා කුඩා මෙන්ම වටිනාකමින් අඩු ඉඩම් කැබලි වන හෙයින් ඒවා බොහෝ විට සංඛ්‍යාලේඛන සැකසීමේදී අතහැර දමනු ලැබේ. තවද කාන්තාවන් බොහෝ විට කරනු ලබන වගාවන් පරිභෝජනය සඳහා වගා කරන ආහාර භෝගයන්ය. එනම් ඒවා වානිජ බෝග නොව යැපුම් භෝග වේ. තවද ජාතික සංඛ්‍යාලේඛන සඳහා දත්තයන් එක්රැස් කිරීමේදී බොහෝ විට ස්ත්‍රී පුරුෂභාවය සළකා බලනු නොලැබේ. එසේ නැතහොත් එම දත්තයන් එක් පැත්තකට බරව එනම් පිරිමින් සම්බන්ධයෙන් පමණක් එක්රැස් කරන අතර ඔවුහු ගෘහමූලිකයන් ලෙස පමණක් ගණන් ගැනේ. මෙම අවාසිදායක තත්ත්වය විසින් දිළිඳුභාවය වඩ වඩාත් කාන්තාවන්ට බලපාන කරුණක් බවට පත්කර ඇත. 1970 දශකයේ සිට දිළිඳුභාවයේ සීමාවට පහළින් ජීවත්වන කාන්තාවන්ගේ සංඛ්‍යාව 50%කින් වැඩිවී ඇත. එය ඔවුන්ගේ පිරිමි සහයින් සමඟ සම්බන්ධවී වැඩිවී ඇත්තේ 30%කින් පමණය. අද කාන්තාව ලෝකයට ආහාර සැපයීමේ නිරතව සිටිනවා විය හැකිය. එහෙත් ඉහත විස්තර කළ බාධක රාශියක් ඔවුන් ඉදිරියේ ඇති හෙයින් වසර 2030 වන විට මිලියන 3 කින් වැඩිවේයයි ගණන් බලා ඇති ලෝක ජනගහනයට අවශ්‍ය අමතර ආහාර අවශ්‍යතාවයන් සපුරාලීමට ඔවුන්ට හැකිවේද?

ලෝකයට ආහාර සපයන්නී කාන්තාව මෙන්ම "මුළු ලොවම පෝෂණය කරන්නීද කාන්තාව" වේ. එබැවින් මුළු ලොවම පෝෂනය කරන කාන්තාව ගැනත් කථා කිරීම කාලෝචිත මාතෘකාවක් බවට පත්ව ඇත. මෙහිදී ලොව පෝෂනය කරණ කාන්තාව සම්බන්ධයෙන් පහත කරුණු යටතේ කථා කිරීම කාලෝචිතය.

1. කාන්තාව මවක ලෙස කරන කාර්ය භාරය
2. කාන්තාව ගෘහනියක් ලෙස කරන කාර්ය භාරය
3. කාන්තාව සංවර්ධනයට විශාල දායකත්වයක් සපයන්නියක හැටියට කරන කාර්ය භාරය
4. දේශපාලන සහ රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදනයේ නියාමකවරියන් වශයෙන් කරන කාර්යභාරය

1. කාන්තාව මවක ලෙස කරනු ලබන කාර්යභාරයේදී අපට අමතක කළ නොහැකි කරුණක් වන්නේ ඇය මන්දපෝෂනය නැති කිරීමට කරනු ලබන කාර්ය භාරයයි. මෙහිදී ඇය මාස 4 සිට අවුරුදු 6 දක්වා දරුවන්ට මව්කිරි දීම කරනු ලබයි. අර්ධ සහ ඝන ආහාර හඳුන්වා දීමත් පවුල්වල සෞඛ්‍ය සංරක්ෂණය සම්බන්ධයෙනුත් විශාල කාර්යභාරයක් සිදු කරයි. පවුල තුළ ඇති අපිරිසිදුකම ඉවත්කර පිරිසිදුකම ඇති කිරීමටද කටයුතු කරන්නී කාන්තාවයි.

2. කාන්තාව ගෘහනියක් ලෙස කරනු ලබන කාර්යභාරයේදී පවුලේ ආදායමට සරිලන පරිදිවියදම් සකස් කරමින් කටයුතු කරන අතර ආහාර සුරක්ෂිතතාවය කෙරෙහිද අවධානය යොමු කරවයි. අඩු වියදම් පෝෂ්‍යදායී ආහාර තෝරාගෙන එදිනෙදා පරිභෝජනයට යොදා ගනිමින් සමබර ආහාරවේලක් සකස්කරමින් නාස්තියපිටු දකිමින් කටයුතු කරන අතර පවුලේ වියදම් තත්ත්වය පාලනය කරමින් විශාල මෙහෙවරක් කරනු ලබයි. තවද ඇය පවුලේ ආර්ථික විශේෂඥවරියක් වශයෙන්ද කටයුතු කරනු ලබයි.

3. කාන්තාව සංවර්ධන ක්‍රියාවලියේ දී විශාල දායකත්වයක් ලබාදෙයි. පුහුණු හා නුපුහුණු කාන්තා ශ්‍රමිකයන් මගින්ද සංවර්ධනයට විශාල දායකත්වයක් ලැබෙන අතර කෘෂිකර්මාන්තයේ නියැලුනු කාන්තවන් සංවර්ධනයට දායක වේ. විවෘත ආර්ථිකය හඳුන්වා දීමත් සමඟ ග්‍රාමීය කාන්තා ශ්‍රමය බහුල වශයෙන් නාගරික ශ්‍රමබලකායට එකතුවුනු අතර ඒමගින් කර්මාන්ත ක්ෂේත්‍රයේ විශාල මෙහෙවරක් කරනු ලබන අතර අප රටට විශාල විදේශ විනිමය ප්‍රමාණයක්ද උපයා දෙයි. විදේශ රැකියාවන් සඳහා විදේශගතවන කාන්තාවන් මගින් අප රටට විශාල විදේශ විනිමය ප්‍රමාණයක් උපයා දෙනු ලබන අතර එය රටේ සංවර්ධනයට මහත් පිටුවහලක් වී ඇත.

4. කාන්තාවන් දේශපාලන කටයුතුවල වර්තමානයේ වැඩි වශයෙන් නියැලී ඇති බැව් දක්නට ලැබේ. ලෝකයේ ප්‍රථම අගමැතිනිය බිහිවූයේද අප ශ්‍රී ලංකාවෙන්ය. ඇය ගරු සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියයි. ඇයගේ දියණිය තවමත් රාජ්‍ය පාලනයේ අතිගරු ජනාධිපතිනි චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිණියයි. ලෝකයේ අනෙකුත් රටවල් වලත් කන්තා නායකවරියන් බිහිවී ඇත. තවද කාන්තා මන්ත්‍රීවරියන් ඇමතිවරියන් ද බිහිවී ඇත. රාජ්‍ය හා පුද්ගලික අංශවල ප්‍රධානීන් වශයෙන්ද කාන්තාවන් කටයුතු කරයි. රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදනයේදී හවුල් කාරියන් වශයෙන් කාන්තාවන් කටයුතු කරයි. "තොටිල්ල පදවන දෑත ලොවක් රජ කරයි" යන පිරුල අපට මෙහිදී සිහිපත් කළ හැකිය.

සිව්පසය එනම් චීවර, පිණ්ඩපාත, සේනාසන, ගිලාන ප්‍රත්‍ය භික්ෂු සංඝයා කෙරෙහිද ගිහියන් උදෙසා එය ඇඳුම්, පැලඳුම්, ආහාර පාන නිවාස සහ සෞඛ්‍ය යන අරුතින්ද භාවිතාවේ. මේ අතරින් අන්නපා ා හෙවත් ආහාර පාන සෑම ජීවියෙකුටම භේදයකින් තොරව අත්‍යවශ්‍ය මූලික අංගයන් බව නම් පැහැදිලිය. එය සබ්බේ සත්ථා ආහාර ටිතිකා "සියලු සත්වයෝ ආහාර මත යැපේ" යන බුදු වදනිනි "ප්‍රාණීනං පුනර් මූලස්ථා හාර" (ජීවීන්ගේ පැවැත්මට ආහාර මූලික වේ.) යන සංස්කෘත වදනින් ද සනාථ වේ.

මේ අනුව බලන කළ ඕනෑම රටක ප්‍රතිපත්ති සම්පාදනය කිරීමේදී එය එරටේ පෝෂණය කෙරෙහිද බලපාන අතර නිවැරදි තීරණ ගැනීම මන්දපෝෂණය පිටුදැකීම හා සංවර්ධනය කෙරෙහිද මේවා විශාල වශයෙන් බලපාන බව පෙන්වා දිය හැකිය. මේ අනුව බලන කළ ඕනෑම රටක ආහාර සපයන්නී මෙන්ම රටක් පෝෂණය කරන්නීද කාන්තාව යනුවෙන් හේතු සාධක ඇතිව ඔප්පු කළ හැකිය. එබැවින් අප කළ යුත්තේ මොවුන්ගේ කාර්යභාරය හා ශක්තිය වටහාගෙන ඔවුන් ධෛර්යමත් කිරීමය.